දකුණු පළාතේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව

ප්‍රධාන ලේකම් අනුමැතිය :- යොමු අංකය: - දිනය:-

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :- යොමු අංකය: - දිනය:-

දකුණු පළාත් ආණ්ඩුකාරවරගේ අනුමැතිය :- යොමු අංකය : - දිනය:-

1. නම : මෙම සේවා ව්‍යවස්ථාව දකුණු පළාතේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

2. ක්‍රියාත්මක වන දිනය : දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කල දින සිට ක්‍රියාත්මක වේ.

3. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

3.1 පත් කිරීම් බලධරයා : දකුණු පළාත් ප්‍රධාන ලේකම්

246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය ... කොට ඇති බව
විසින් 2014.05.21 1
සහතික කරමි 30
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

4. නිලධර ගණය පිළිබඳ විස්තර

4.1 නිලධර ගණය : ආශ්‍රිත නිලධාරී

4.2 ශ්‍රේණි : III, II, සහ I ශ්‍රේණිය

4.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන යෝජනා ක්‍රමයන්හි අපේක්ෂිත අරමුණු ලබා කර ගැනීමේ කාර්යයන්හිදී විධායක මට්ටම් වල කාර්යභාරයට උපස්ථම්භක වන්නා වූ, විමර්ශන තොරතුරු හා දත්ත රැස් කිරීම/ විශ්ලේෂණය/ වාර්තා සම්පාදනය, සමීක්ෂණ වැනි කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්යභාරයක් එම තනතුරු දරන්නන්ට පැවරේ.

5. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

6. අර්ථ නිරූපණ හා නිර්වචන:

6.1 "ව්‍යවස්ථාව" යන පදයෙන් අදහස් කරනුයේ දකුණු පළාතේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවයි.

6.2 "සේවය" යනුවෙන් අදහස් කරනුයේ දකුණු පළාතේ සංවර්ධන නිලධාරී සේවයයි.

6.3 "සක්‍රීය සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ රජයේ චුවමනාවන්ට හෝ/හා රජයේ ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව ස්වකීය තනතුරට අදාල වැටුප්

[illegible] 2014.05.21 [illegible] ඇති බව
2014.05.26

ලබමින් තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන ලද කාල සීමාව වේ.

6.4 බලාත්මක වන දිනය යනුවෙන් අදහස් කරනුයේ පළාත් ආණ්ඩුකාරවර විසින් මෙම ව්‍යවස්ථාව අනුමත කල දිනය වේ.

6.5 "ප්‍රධාන ලේකම් " යනුවෙන් අදහස් කරන්නේ දකුණු පළාතේ ප්‍රධාන ලේකම්වරයා වෙයි.

6.6 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරන්නේ අදාල නිලධාරියා ඒ වන විට සේවය කරමින් සිටින්නේ දකුණු පළාත් සභාවේ යම් අමාත්‍යාංශයක් යටතේ ද , එකී අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙයි.

6.7 " දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරන්නේ අදාල නිලධාරියා ඒ වන විට සේවය කරමින් සිටින්නේ දකුණු පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවක් යටතේද, එකී දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙයි.

6.8 සතුටුදායක සේවයක් යනු පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම මගින්ද සිදු කල යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද එම කාලය තුලදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

අනුමත අංකය ....246....

දකුණු පළාත් ගරු ....ආණ්ඩුකාරතුමා.... විසින් ....2014.05.21.... දින අනුමත කොට ඇති බව සහතික කරමු. ....30....

2014.05.26

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

7. වැටුප්

7.1 වැටුප් කේත අංකය : MN 4 – 2006 (ඒ)

7.2 වැටුප් පරිමාණය : රු15,215- 10×215 - 4×240 - 7×320 - 15×360 – 25,965/-

7.2 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	වැටුප් තලය (රු.)
III	01	15,215/-
II	12	17,605/-
I	23	20,925/-

8. නිලධර ගණයට අයත් තනතුරු :

8.1 අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව :

අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	කාර්යයන්
සංවර්ධන නිලධාරී	2163	විමර්ශන, තොරතුරු හා දත්තරැස්කිරීම/විශ්ලේෂණය/වාර්තා සම්පාදනය සමීක්ෂණය අතුළුව සංවර්ධන යෝජනා ක්‍රමයන්හි අපේක්ෂිත අරමුණු ලඟා කර ගැනීමේ කාර්යයේදී අදාල වන්නාවූ ක්ෂේත්‍ර හා කාර්යාල ගත කාර්යයන් හා/හෝ පවරනු ලබන

අනුමත අංකය ...246...
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014-05-21 දින අනුමත කොට ඇති බව සහතික කරමි. ...30...

2014.05.26

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

		වෙනත් කාර්යයන්

8.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා : III, II, හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

9. බඳවා ගැනීමේ ක්‍රමය

9.1 බඳවා ගන්නා අනුපාතය

ධාරාව	ප්‍රතිශතය
විවෘත	100%

9.2 විවෘත බඳවා ගැනීම

9.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

9.2.2 සුදුසුකම් :

9.2.2.1 අධ්‍යාපන සුදුසුකම්:

අ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

9.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

9.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ.

9.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් [illegible]තුරේ රාජකාරි ඉටුකිරීමටත්

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු [illegible]
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි.
[illegible]
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

9.2.2.5 වෙනත් :

I. අයදුම්කරු විසින් තමන් රැකියා විරහිත උපාධිධාරියෙකු බවට දිවුරුම් ප්‍රකාශයක්/ ප්‍රතිඥාවක් ඉදිරිපත් කල යුතු අතර ඔහු ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් විසින් ද අයදුම්කරු රැකියා විරහිත අයෙකු බව සහතික කර තිබිය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. පූර්වාසන්න වසර 05ක කාලයක් තුල දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

IV. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

9.2.3 වයස :

9.2.3.1 අවම සීමාව : අවුරුදු 21 යි.

9.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35 යි.

9.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : * ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

අනුමත අංකය 246
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 30
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

9.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

9.2.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

9.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් සහ අනෙකුත් සුදුසුකම්	30	ඉහළම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.
2. විෂය බාහිර ක්‍රියාකාරකම්	30	
3. භාෂා ප්‍රවීණතාව	20	
4. පරිගණක සාක්ෂරතාවය	15	
5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව	05	
6. එකතුව	100	

9.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව සහතික කරමි. පිටු 30
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

9.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

9.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ප්‍රසිද්ධ දැන්වීමක් මඟින්

9.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

9.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

10. කාර්යක්ෂමතා කඩඉම්

10.1

කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග	කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද	කාර්යක්ෂමතා කඩඉමෙ ස්වභාවය ලිඛිත / වෘත්තීය / සහතික පාඨමාලා / වෙනත්
1 වන කාර්යක්ෂමතා කඩඉම	III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර	* ලිඛිත (ඇමුණුම 01)
2 වන කාර්යක්ෂමතා කඩඉම	II ශ්‍රේණියට උසස් වී වසර (03)ක් ගත වීමට පෙර	* ලිඛිත (ඇමුණුම 02)
3 වන කාර්යක්ෂමතා කඩඉම	I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05)ගත වීමට පෙර	* ලිඛිත (ඇමුණුම 03)

10.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක්

අනුමත අංකය ...246...
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව සහතික කරමි.
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

(19)

10.3 කාර්යක්ෂමතා කඩඉම් පවත්වන බලධරයා:විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

11 රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

11.1

භාෂාව	ලබා ගත යුතු ප්‍රවීණතාවය
රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.
අනෙකුත් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 විධි විධානයන්ට අනුව අදාල මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

12. ශ්‍රේණි උසස් කිරීම

12.1 **III** වන ශ්‍රේණියේ සිට **II** ශ්‍රේණියට උසස් කිරීම

12.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

12.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව සහතික කරමි
30
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

ii. නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගැයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

12.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම, නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීමේ බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
30
සහතික කරමි.
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

12.2. 11 වන ශ්‍රේණියේ සිට 1 ශ්‍රේණියට උසස් කිරිම

12.2.1. සාමාන්‍ය කාර්යසාධනය අනුව

12.2.1.1.සපුරාලිය යුතු සුදුසුකම්

(i) නිලධර ගණයේ 11ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක(10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම හා වැටුප් වර්ධක දහයක්(10) උපයාගෙන තිබිම.

(ii) අනුමත කාර්යසාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක්(10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිම.

(iii) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම.

(iv) අදාල කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය නියමිත දිනට සමත්වී තිබිම.

12.2.1.2. උසස් කිරිමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් 1ශ්‍රේණියට උසස් කිරිම සඳහා පත්කිරිම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් නියමිත ආකෘතිය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරිම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරිමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 30 කි.
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

13 තනතුරු වලට පත් කිරීම : අදාළ නොවේ.

14 සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම (ව්‍යවස්ථාව බලාත්මක වන දිනට සේවයේ යෙදී සිටිනන්ට පමණක් අදාල වේ.

රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය මත 1999 සිට සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින (ආණ්ඩුකාරවර විසින් අනුමත කල දිනය) දක්වා කාලය තුළ විවිධ තනතුරු නාම යටතේ දකුණු පළාතේ පළාත් රාජ්‍ය සේවයට බඳවා ගත් සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත MN 4 – 2006 (A) වැටුප් ක්‍රමය ලබා දී ඇති නිලධරයන් පහත දක්වා ඇති විධිවිධාන යටතේ දකුණු පළාතේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.1 පොදු කරුණු:

I. අන්තර්ග්‍රහණය වීමට මනාපය පළකරන සියලුම නිලධාරීන් ආයතන ප්‍රධානියා මඟින් මෙම ව්‍යවස්ථාවේ පළමු පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

II. ආයතන ප්‍රධානියා විසින් තමා වෙත ලැබෙන අයදුම්පත් මෙම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුලත ප්‍රධාන ලේකම් වෙත එවිය යුතුය.

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආර්.ඩී. කාරියවසම
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි පිටු 30 කි.

2014.05.27

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

III. ප්‍රධාන ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් අවශ්‍ය ලිපි ලේඛන හෝ විස්තර සැපයීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

IV. අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ට විධිමත් පත්වීමේ ලිපියක් ප්‍රධාන ලේකම් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

14.2 ක්‍රමවේදය

i. III ශ්‍රේණිය

(අ) MN 4 – 2006 ඒ වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්,

(ආ) MN 4 – 2006 ඒ වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට උසස් කිරීම සඳහා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii. II ශ්‍රේණිය

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමිය
විසින් 2014.05.21 ... අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 30 ...
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

(අ) MN 4 – 2006 ඒ වැටුප් පරිමාණය යටතේ IIIශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) නොඅඩු එහෙත් අවුරුදු විස්සකට (20) අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක සියල්ල උපයා ගෙන ඇති හා නව සේවා ව්‍යවස්ථාව ක්‍රියත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධරයන්.

(ආ) MN 4 – 2006 ඒ වැටුප් පරිමාණය යටතේ II ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධරයන්,

(ඇ) MN 4 – 2006 ඒ වැටුප් පරිමාණය යටතේ II ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවාකාලය වසර දහය (10) සම්පූර්ණ වුවද , ඉහත සදහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා නොමැති නිලධරයන්,

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආ...
විසින් 2014.05.2 ... අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 30
2014.05.26
ආණ්ඩුකාර ලේකම්

රජය විසින් සහ දකුණු පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා/ හෝ රෙගුලාසි අදාල වේ.

16 ස්ථාන මාරු කිරීම :

සේවයේ අවශ්‍යතාවය මත දකුණු පළාත් ප්‍රධාන ලේකම් / පළාත් අමාත්‍යාංශ ලේකම්/ පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ස්ථාන මාරු වීම් කල හැකිය.

17 අන්තර්කාලීන විධිවිධාන.

17.1 අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය යටතේ මෙම සේවයට අන්තර්ග්‍රහණය වන නිලධාරින් සඳහා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් හා අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා වසර තුනක සහන කාලයක් ලබා දෙනු ඇත. එම කාලය තුළ ඔවුන් විසින් නව සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් කර ඇති අවශ්‍යතා සපුරා ගත යුතුය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණයට පෙර එම නිලධාරින් සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ගෙන් සමත්ව ඇත්නම් මෙම ව්‍යවස්ථාවේ සඳහන් අදාල කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

17.2 දකුණු පළාත් සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන නිලධාරීන් ට ඔවුන් දැනට දරණ තනතුරේ තවදුරටත් සේවය කළ හැකිය. මෙම සේවයට අන්තර්ග්‍රහණය වීමට සුදුසුකම් ඇති එහෙත් අන්තර්ග්‍රහණය වීමට මනාප පළ නොකරන නිලධාරීන්, ඒ බවට පසුව වෙනස් කළ නොහැකි ප්‍රකාශයක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් නව ව්‍යවස්ථාව ගැසට් පත්‍රෙය් පළ වන දිනයේ සිට මාස තුනක් (03) ඉකුත් වන දිනට පත්වීම් බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බවට
සහතික කරමු. පිටු 30 යි.

2014.05.22

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

17.3 එලෙස අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන නිලධාරීන්ට පෞද්ගලික වන සේ පමණක් එම තනතුරු පැවතිය යුතු අතර, එවැනි තනතුරක පුරප්පාඩුවක් ඇති වූ විට එම තනතුරු නාමය යටතේ බඳවාගැනීම් නොකළ යුතුය.

බඳවා ගැනීම් කළ යුත්තේ මෙම ව්‍යවස්ථාව යටතේ පමණකි.

18 මෙම සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත පළාත් ආණ්ඩුකාරවරයාගෙන් විමසා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය මත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

ඇමුණුම - 01

දකුණු පළාතේ සංවර්ධන නිලධාරී සේවයේ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

1. විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
01. කාර්යාල ක්‍රම	පැය 01	100	40%
02. ගිණුම් ක්‍රම	පැය 01	100	40%
03. පරිගණක පරීක්ෂණ	පැය 02	100	40%

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි පිටු 30 යි.
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

2. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් හෝ පවත්වනු ලැබේ.

3. අදාල සේවයට ඇතුලත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝරාජ්‍ය භාෂාවකින් හෝ නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර තුනකට පිළිතුරු සැපයිය යුතු වේ. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර තුනකට පිළිතුරු සැපයිය යුතු වේ.

4. නිලධරයන්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාරවල දී විභාගයට පෙනී සිටීමට හැකි වේ. එතෙකුදු වූවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.

5. විභාගය සඳහා විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1. කාර්යාල ක්‍රම	රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද, රාජකාරි ලිපි ලේඛණ මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ

අනුමත අංකය ...246...
දකුණු පළාත් ගරු ...[illegible]...
විසින් 2014.05.21 ... දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 30 යි.
2014.05.26
ආණ්ඩුකාර ලේකම්

	නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාවද පරීක්ෂා කෙරේ.
2. ගිණුම් ක්‍රම	රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.
3. පරිගණක පරීක්ෂණය	I. තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප II. වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය III. ගොනු කළමනාකරණය IV. වදන් සැකසුම මූලික කුසලතා, තිරයට හුරු වීම, පාඨ සංරක්ෂණය, පාඨ එකේලි කිරීම, අකුරු වර්ගය හා උපලක්ෂණ ,අනුච්ඡේද, ඡේද, පේලි අතර පරතරය වෙනස් කිරීම,පිම් අනුයෝගය (Tab setting) පාඨයක්සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද, තීරු යෙදීම, පිටුව සැකසීම, ලේඛණ මුද්‍රණය,

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි ... 30 ... සී.
2014-05-26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

වගු නිර්මාණය, අනුපිළිවෙලට සැකසීම,ගොනුකළමනාකරණය , ලේඛනයක් ලිපින කිහිපයකට යැවීමට සැකසීම, මැක්‍රෝ භාවිතය

V. පැතුරුම්පත්,

මූලික කුසලතා

ආකෘතිකරණය (Formating)

සංස්කරණය

තීරු හා පරාස,

නව ඇතුලත්කිරීම හා ඉවත් කිරීම

දත්ත අනුපිළිවෙලට සැකසීම

ප්‍රස්තාර සැකසීම්

මුද්‍රණය

@ ශ්‍රිතය (@ Function)

මැක්‍රෝ භාවිතය

~~ගොනු කළමනාකරණය~~

VI. දත්ත සමුදාය

හැඳින්වීමේ මූලික කුසලතා

දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය

ආකෘති

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය
විසින් 2014.05.2 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. හිමු 30 කි.

2014.05.22

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

සන්ධානගත ආකෘති

උත්පතනආකෘති (Popupforms)

සංවාද හා පණිවිඩ කොටු

විමසුම්

අනුපිළිවෙලට සැකසීම

වාර්ථා ලබා ගැනීම

මැක්‍රෝ භාවිතය

VII. ඉදිරිපත් කිරීම / චිත්‍ර සටහන්

මූලික කුසලතා,

සංස්කරණය, ආකෘතිකරණය,

සැලසුම් යෙදීම

අනුරූප, පසුරු සිත්තම් හා

ප්‍රස්ථාර නිවේශනය

කදාමාරුව හා සජීවකරණය,

ඉදිරිපත් කිරීමේ මෙවලම්

භාවිතය

මාස්ටර් (Master) කදාව

සැකසීම

කදා මුද්‍රණය හා සටහන්

VIII. අන්තර්ජාලය

අන්තර්ජාලය හැඳින්වීම විශ්ව

විසිරි ජාලය,

මං සොයන ආකාරය,

අනුමත අංකය 246

දකුණු පළාත් ගරු ආචාර්‍ය ... විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව

සහතික කරමි. ... 30 ... සි.

2014.05.22

[illegible]

දකුණු පළාත

	ව්‍යවහාරික අන්තර්ජාලය IX. විද්‍යුත් තැපැල (E-mail) හැඳින්වීම මූලික කුසලතාව විද්‍යුත් තැපැල ලබා ගැනීම විද්‍යුත් තැපැල යැවීම ඊට ප්‍රතිචාර දැක්වීම ඇමුණුම් භාවිතය ලිපිනය හඳුනා ගැනීමට කෙටි නම් භාවිතය පණිවුඩ සම්පාදනය

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 30 කි.

2014.05.26

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

ඇමුණුම - 02

දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවයේ 2වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

1) විභාගය පිළිබඳ විස්තර:

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
1.ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති	පැය 02	100	40%
2. මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	පැය 02	100	40%

2) මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් හෝ පවත්වනු ලැබේ.

3) අදාල සේවයට ඇතුලත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන්

අනුමත අංකය 24
දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමා
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 30
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

(12)

හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

4) නිලධරයින්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාර වලදී විභාගයට පෙනී සිටීමට හැකි වේ. එතෙකුදු වුවත් සමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.

5) විභාගය සඳහා විෂය නිර්දේශය

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1. ආයතන සංග්‍රහයහා කාර්ය පටිපාටික රීති	ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති
2. මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	පරිච්ඡේද I, II, III, IV, V හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

අනුමත අංකය 246
2014.05.21
30
2014.05.26

ඇමුණුම - 03

දකුණු පළාතේ සංවර්ධන නිලධාරී සේවයේ III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

1) විභාගය පිළිබඳ විස්තර:

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
ව්‍යාපෘති කළමනාකරණය	පැය 03	100	40%

2) මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් හෝ පවත්වනු ලැබේ.

3) අදාල සේවයට ඇතුලත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් නිලධාරීන් විසින් මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතු වේ.තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පිළිතුරු සැපයිය යුතු වේ.

4) සාමාර්ථය සඳහා විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතු වේ.

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු [illegible]
විසින් 2014.05.21 [illegible] කොට ඇති බව
සහතික කරමි. [illegible] 30 ...
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

5) විභාගය සඳහා විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
ව්‍යාපෘති කළමනාකරණය	I. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම II. ව්‍යාපෘති කළමනාකරණය III. ව්‍යාපෘති චක්‍රය *IV. ව්‍යාපෘති පිළියෙල කිරීම හා විග්‍රහ කිරීම* V. ව්‍යාපෘති ඇගයුම ➢ පිළිගෙවුම් කාලය ➢ ශුද්ධ වර්තමාන වටිනාකම ➢ අභ්‍යන්තරප්‍රතිලාභ අනුපාතය ➢ පිරිවැය ප්‍රතිලාභ අනුපාතය ➢ වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය VI. ව්‍යාපෘති සංවිධානය VII. ණය මිල යොදා ගැනීම

අනුමත අංකය 240
දකුණු පළාත් ගරු [illegible]
විසින් 2014-05-21 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 30 කි.

2014-05-26

කාර ලේකම්
පළාත

පළමු පරිශිෂ්ඨය

දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවය

අන්තර්ග්‍රහණය සඳහා ඉල්ලුම් පත්‍රය

1 කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි.

1. සේවා ස්ථානය හා ලිපිනය

....

....

....

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම

....

....

....

(මෙනවිය/මහත්මිය/මහතා)

3.(i) උපන් දිනය .... (ii) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට වයස......................

4. දැනට දරන තනතුර..

5. පත්වීමේ ස්වභාවය..

5.1 තනතුරට අදාල මුල් පත්වීම් දිනය..............................

අනුමත අංකය 246

දකුණු පළාත් ගැ... ආණ්ඩුකාරතුමා

විසින් 2014.05.21 ... දින අනුමත කොට ඇති බව

සහතික ... 30 ... මි.

2014.05.26

ආණ්ඩුකාර ලේකම්

5.2 පත්වීම ස්ථිර කල දිනය හා ලිපියේ අංකය..........................

5.3 වර්ෂ 1994 සිට ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින දක්වා .... කාලය තුල උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ පත්වීම් ලැබුවෙක්ද යන්න සඳහන් කරන්න..

....

5.4 ඉහත 5.2 පරිදි හැර වෙනත් ආකාරයකින් පත්වීම් ලැබුවේ නම් එහි ස්වභාවය සඳහන් කරන්න..

....

....

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 අනුව,

1. වැටුප් පරිමාණය

....

2. වැටුප් කේත අංක

....

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව,

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු. ආර්ථිකාර්ගුණ
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. නිල 30 ක්
2014.05.26
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

1. වැටුප් පරිමාණය

....

2. වැටුප් කේත අංක..

3. .... වැනි දිනට

(අ) වැටුප් තලය රු. ....

(ආ) වැටුප් පියවර අංකය ....

8. දැනට සිටින තනතුරට බඳවා ගැනීමේ පටිපාටිය අනුව දැනට තනතුරට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්

....

....

9. රාජකාරි විස්තරය (සැකෙවින්)

....

....

10.1. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාව අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වී ඇත්නම් සමත් වූ දිනයන්

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය
විසින් 2014.05.21 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 30 යි.

2014.05.26

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය

1. ....
2. ....
3. ....

11. සේවා කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න.)

සිට	දක්වා	තනතුර	සේවා ස්ථානය	සේවා කාලය (අවුරුදු)

12. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය ....

අයදුම්කරුගේ අත්සන

2 කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයි.

13. අයදුම්කරු විසින් 1 සිට 11 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි අතර, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් වැටුප සඳහා නිර්දේශ ලබාදුන් ලිපියේ පිටපතක්ද, ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම

අනුමත අංකය 246
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2014.05.21 [illegible] කොට ඇති බව
සහතික කරමු. පිටු 30 ක.

2014.05.26 ....

ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුය.)

....

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

3 කොටස - දකුණු පළාතේ ප්‍රධාන ලේකම්ගේ ප්‍රයෝජනය සඳහා

19 අයදුම්කරු/අයදුම්කාරිය මෙම සේවයට අන්තර්ග්‍රහණය කරමි/නොකරමි.

20 අන්තර්ග්‍රහණය නොකරන්නේ නම් ඊට හේතු

....

....

21 අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණිය ....

....

....

දිනය බලය පැවරුණු නිලධාරියාගේ අත්සන

❖ අනවශ්‍ය වචන කපා හරින්න.

අනුමත අංකය 246

දකුණු පළාත් ගරු [illegible] විසින් 2014.05.24 දින අනුමත කොට ඇති බව සහතික කරමු. පිටු 30 යි.

2014.05.26

ආණ්ඩුකාර ලේකම් දකුණු පළාත